නිපුණතාවය 03 - පරිගණකයෙහි දත්ත හා උපදෙස් නිරූපණය කරන ආකාරය විමර්ශනය කර ඒවා ගණිතමය සහ තාර්කික මෙහෙයුම් සඳහා යොදා ගනී.
නිපුණතා මට්ටම 3.3 - ද්විමය සංඛ්‍යා සඳහා මූලික අංක ගණිත සහ තාර්කික මෙහෙයුම් භාවිත කරයි.

**1.බිටු අනුසාරිත NOT මෙහෙයුම-**ලබා දෙන ද්විමය සංඛ්‍යාවක එක් එක් බිටුව වෙන වෙනම ගෙන 1හි අනුපූරකයෙන් ප්‍රතිදානය ලබා දෙන තාර්කික ක්‍රමවේදය NOT මෙහෙයුම ලෙස හැඳින්වේ.

| A | NOT A |
|---|---|
| 0 | 1 |
| 1 | 0 |

**2.බිටු අනුසාරිත AND මෙහෙයුම-**ද්විමය නිරූපණ දෙකක් මෙම මෙහෙයුම සඳහා යොදා ගනු ලැබේ.එම නිරූපණ දෙකෙහි එක් එක් බිටු යුගලය ගුණ කිරීමෙන් බිටු අනුසාරිත AND මෙහෙයුම සිදු කරනු ලැබේ.මෙම මෙහෙයුමේදී ඒ සඳහා යොදා ගනු ලබන බිටු අගයන් දෙකම 1 ලෙස පවතින්නේ නම් පමණක් ප්‍රතිදානය 1 ලෙස ලබා ගනී.

පහත ගැටළු විසඳන්න.

1.) 1110
+111

2.) $101_2$
$-011_2$